කෙටිකතාව

# මවුවරුන් ගේ දිනය

කැත්ලින් ජයවර්ධන



ඔහු අධ්‍යයනාගාරය තුළට වී රාක්ක අල්මාරි අවුස-ˆසමින් පොත්පත් පෙරළමින් සිටියේ ය. ඒ, සූර්ය මංගල්‍යය පිළිබඳ ව සැපැයිය හැකි අලුත් ම නිර්වචනය සොයා ය. අවුරුද්ද පිළිබඳ විවිධ මතිමතාන්තර සටහන්වුණා පුවත්පත් ලිපි, අතිරේක, සහිත ලිපිගොනුව පෙරළමින් සිටි ඔහුට, පෙනී ගියේ ඒ කිසිවක් තමා ගේ ඉලක්කය සපුරා ගැනීමට තරම්වන දෙයක් නොමැති බව ය. ලඅවුරුද්දල යනු සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට සංක්‍රමණය වීම යැයි පුනපුනා පැවසීමේ කිසිදු අර්ථයක් නැත. නවතාවක් ද නැත. අඩු තරමින් මේ සංක්‍රාන්තිය මුල්වරට සිදුවූයේ කවර නම් කාලවකවානුවක ද යන්න එළිදැක්වීමට හෝ අපොහොසත් වුවහොත් සංවාද මණ්ඩපය මඟින් අලුත් දැනුමක් බෙදා හදා දිය හැකි නො වෙයි. එවිට තමා පත්වන්නේ හුදු විද්වත් රූකඩයකු බවට ය. ප්‍රේක්ෂකයාට වඩාත් ආකර්ෂණය වන්නේ අලුත් අවුරුද්දේ සාම්ප්‍රදායික රුවගුණ වැනුමකට වඩා එහි ඇති විද්‍යාත්මක පදනම විශ්ලේෂණය කිරීම ය. පොළොව හිරු වටා ගමන් ගන්නේ ඉලිප්සාකා-ාරයෙනි යි තමාට පැවසිය හැකි ය. ජ්‍යොතිෂ්‍යයෙහි සඳහන් කෘත යුගය, ත්‍රේත යුගය, ද්වීපර යුගය ගැන හෝ ඉපැරැණි භාරතයේ අහස බෙදා තිබූ නැකැත්වල ස්වභාවය සාකච්ඡාව සඳහා යොදාගැනීමේ ද වරදක් නැත. මේ සියල්ල කළයුතු වන්නේ යථාර්ථවාදී බුද්ධිවාදී පදනමක පිහිටා ය. කෙසේ වුව ද රූපවාහිනී සංවාද මණ්ඩපයක දී ප්‍රේක්ෂකයාට හැඟෙන දැනෙන අයුරින් තේරෙන භාෂාවෙන් කතා කිරීම කථකයා ගේ ජනප්‍රියත්වයට ඉවහල් වන්නකි. එහෙත් ඉඳහිට නොතේරෙන වචනයක් දෙකක් පැවසීම ද අවාසිදායක නැත. ශාස්ත්‍රීය කතාන්දරයක් * ප්‍රවාදයක් හැඩතල ගැන්විය යුතු වන්නේ පරිස්සමින් බව ද මතක තබාගත යුතු ව තිබේ.

දුරකථනයේ අමිහිරි සංධ්වනිය නාද නංවන්නට වූයේ ඔහු මේ ප්‍රශ්න අතරේ දෝලනය වෙමින් සිටිය දී ය. සියුම් කෝපයකට මුසු වූ අසහනය, සිත තුළ දෝරේ ගලා යනු ඔහුට හැඟිණ. ශාස්ත්‍රීය කටයුත්ත, අධ්‍යයනයක යෙදෙන හැම අවස්ථාවක ජයගත නො හැකි බාධකයක් බවට දැන් දැන් පත්වෙමින් ඇත්තේ මේ දුරකථන ඇමතුම් ය.

"තාත්ති * තාත්ති"
සිතෙහි වූ ගැටලූ සහගත බව, කෝපයක් කරා ස්ථාන මාරු කරනු ඔහුට හැඟිණ.

"මං ගෙදර නැහැයි කියන්න කියල මෙච්චර මේ ළමයට කියලත්..."

රිසිවරය තැබූ හිමාන්සු අධ්‍යයනාගාරය කරා දුවගෙන එන පා හඬ ඇසිණ. අනතුරු ව දොරරෙද්දි දෙබෑවනු ද පෙනුණේ ය.

"මොකක්ද පුතා, ඔයාට ඔච්චර කියලත්..."
"තාත්ති... යි ඔහුට බාධා කරමින් හිමාන්සු උස් හර්ඩින් කීවේ තමාට ද කියන්නට යමක් ඇති බව හඟවමිනි.

"තාත්ති, තාත්තිට කතා කරන්නේ ආත්තම්මා"

සුනාමියෙන් සුන්නද්දූලි වූ තෙල්වත්තේ තමා විසින් අලුතින් පිළිසකර කර දෙන ලද නිවහනෙහි හුදෙකලා ව පසුවන අම්මා ගේ වැහැරුණු මුහුණ ඔහු ගේ මතක තිරයේ ඇඳී බොඳ වී ගියේ ය. අසහනය මර්ඩිමින් දයානුකම්පාවක් නැඟුණ ද දීර්ඝ සංවාදයකට මුලපිරීමට මෙය අවස්ථාව නොවන බව ද සිහිවිණ.

"අනේ පුතා, ආත්තම්මාට කියන්න, තාත්ති ඉක්මනටම ආපහු කෝල් කරනවයි කියලා"
තමා ඒ බැගෑපත් වූයේ කුඩා පුතුට බව ඔහුට මතක් වන විට, හිමාන්සු පසුවූයේ ඈතට දිවයමිනි.

"දෙයියන්නාස්සේ කතා කළත්, ආයි නං මට පණිවිඩ අරං එන්න එපා"යි එවර ඔහු හඬනගා කීවේ පුතු මෙන් ම මව ද එය ශ්‍රවණය කළ යුතු වූ නිසා ය.

අලුත් නිර්වචන සොයමින් අවුරුද්ද පිළිබඳ ව ලියැවුණ පොතක් පෙරළූ ඔහුට බටහිර තාරකා විද්‍යාවේ ඒ පිළිබඳ නිර්වචන සතරක් ඇති බව සොයා ගත හැකි විණි. බටහිර වැසියන් ගේ තාරකා විද්‍යාවට අනුව සූර්යයා මේෂ රාශියට සංක්‍රමණය වන්නේ අප්‍රියෙල් දහතුන හෝ දහහතර විය හැකි නො වේ. පැරැණි යුදෙව් දින දර්ශනයට අනුකූල ව එය සිදුවිය හැක්කේ ඊට වඩා දින කිහිපයක් ම ප්‍රමාද වී ය.

"අනේ අනේ ඔයාගේ තේ කෝප්පේ ඇල්වතුර වෙලා ඇති. ඔය වැඩේ කරන ගමම්ම ඕක බීල දාන්නකෝ උගුර උගුරවත්"

දොරරෙද්දි දෙබෑ කරගෙන එවර මතු වූයේ වසන්ති ය. මොන ඉලවුවක්දැයි ඔහු ගේ සිත කීවේ ය. එහෙත් දෙතොල මතු කළේ මඳ සිනාවකි.

"අම්මා නේද කෝල් කළේ?"
"හ්ම්"
"මක්කිවුව ද?ල"
"මං කිවුවා පස්සේ කතා කරන්නම් කියලා"
"ඉතිං කතා කළාද?"
"නෑ. පස්සේ කතා කරනවා"

හදිසියේ අවදි වූ මව පිළිබඳ ස්මරණය ඔහුට අලුත් ඉසවුවකට පාර කිව්වේ ය. රූපවාහිනී සාකච්ඡාව සඳහා ද ඉන් තමාට කිසියම් උත්තේජනයක් ලැබුණ අයුරක් ඔහුට හැඟිණ. මාපියන්ට සැලැකීම, වැඩිහිටියන්ට වැඳ නමස්කාර කිරීම ආදී සාරදහම් පිළිබඳ ව නව දෘෂ්ටියකින් හා නැවුම් මානයකින් යුතු ව ප්‍රේක්ෂකයාට යමක් කියා දීම අවුරුදු උදාව පිළිබඳ නිර්වචන සෙවීමට වඩා පහසු ය.

"හෙට අපි තෙල්වත්තට යනකොට ටිකක් හවස්වේවි නේද ඔයාගෙ ටීවී ප්‍රෝ_ග්‍රෑම් එක නිසා?"

ඔහු නිරුත්තර ව සිටියේ ය. වසන්ති එසේ කියන්නේ තමා ගේ රූපවාහිනී වැඩසටහන පිළිබඳ අහිතකින්, අසතුටකින් නොවන බව ඔහු දනී.රූපවාහිනියේ තමා පෙනී සිටින සෑම වාරයක දී ම වැඩි ම දුරකථන ඇමතුම් සංඛ්‍යාවක් ගලා එන්නේ වසන්තිට ය.

ඇගේ යෙහෙළියන් ඒ කතා කරන්නේ තමා ගේ අදහස් උදහස් අගයමින් බව ඔහු වටහාගන්නේ වසන්ති ඒවාට දෙන පිළිතුරු ඔස්සේ ය. ඒ ප_ශංසා අසන වසන්ති ගේ මුහුණ මලක් මෙන් විකසිත වෙයි. වෙනසක් නොපෙන්වා සිටින්නට කොතෙක් වෑයම් කළ ද ඔහු ගේ සිතට ද ඉන් ලැබෙන්නේ සන්තෝෂයකි.

රූපවාහිනී වැඩසටහන් යෙදී තිබුණේ අවුරුදු කුමරු ගේ සම්ප්‍රාප්තිය සිදුවන යාමයේ ම ය.

මඟහැරිය නොහැකි සජීවී සංවාදයට ඔහු සහභාගී වූයේ දෙගිඩියාවකින් යුතු ව ය. සංවාදය නිම වන විට මධ්‍යාහ්නයට ද ආසන්න ව තිබිණ. ඔහු නිවස බලා රිය පැදවූයේ උපරිම වේගයකිනි. පොළොස් ඇඹුලක්. කිරිහොද්දක් තිබ්බටු මාළුවක් ඇතුළු ව්‍යංජන හතඅටක් දීසිවලට බෙදාගෙන අම්මා මේ වනවිට මඟ බලමින් සිටිනු ඇත්තේ තමා එනතුරු ය. එහෙත් වෙනදා මෙන් අවුරුදු දවසේ දවල් කෑම තෙල්වත්තේ දී ගැනීමට මෙවර ද තැත් කළහොත් හාමත් වීමට සිදු වෙයි. ගෙදර කුස්සියේ දවල් කෑම පිළියෙල වී නැති නිසා, උදේ කිරිබත්වලින් දෙවන වරටත් සප්පායම් වී කුසගිනි නිවාගැනීම නුවණට හුරු ය. තෙල්වත්ත බලා ගමන් ඇරැඹිය යුත්තේ ඉන් අනතුරු ව ය.

"අපි බැලූවා තාත්තිගෙ ටීවී ප්‍රෝ_ග්‍රෑම් එක" යි ඔහු වාහනයෙන් බිමට බසිත් ම ඉදිරියට දිව ආ හිමාන්සු කීවේ ය. අලුත් කලිසමකින් හා කමිසයකින් සැරැසී සිටි පුතු වෙතින් මෙන් ම දිලිසෙන සාරියක් හැඳ සිටි වසන්ති වෙතින් ද නැවුම් අවුරුදු සුවඳක් වහනය වෙමින් තිබිණ.

මුහුදු තීරය ඔස්සේ තරමක වේගයෙන් රිය පැදවිය හැකිවූයේ වාහන තදබදයක් නො වූ නිසා ය. මුහුදු රළ උදාසීන ලෙස වෙරළ සිඹිමින් තිබෙනු පෙනිණ. සුළඟ ද හැමුයේ වියළි බවකින් යුතු ව ය.

"මදර්ස් ඩේ හොඳ නැහැයි කියලා තාත්ති කිවුවෙ ඇයි?"
"හොඳ නැහැ කිව්වා නෙවෙයි පුතා. තාත්ති කිව්වෙ එක දවසකදි විතරක් මදර්ස් ඩේ සෙලිබ්‍රේට් කරන එකේ තේරුමක් නෑ කියලා"

"එක දවසක් විතරක්?"
"ඔව් පුතා. මදර්ස් ඩේ කියන්නෙ මේ අපේ එකක් නෙවෙයිනේ. ඒක තියන්නෙ පිටරටවල. දන්නැද්ද ඒ අය වැඩ කරන්නෙ මැෂින් වගේනේ. අම්මා තාත්තා ගැන නෑදෑයො ගැන සොයන්න බලන්න ඒ අයට වෙලාවක් නෑ. රොබෝලා වගේ තමයි ඉතින්"

"ඉතිං තාත්තිත් වැඩකරනව නේ?"

"ඔව්. ඒක තමයි ඒ ගොල්ලගෙයි අපෙයි අතරේ තියන වෙනස. අපි දාහක් වැඩ රාජකාරි තිබුණත් අම්ම තාත්ත ගැන සොයලා බලනවා. ඒක අපේ සංස්කෘතියේ ම අංගයක්. සංස්කෘතික ලක්ෂණයක්?"

හිමාන්සු නිහඬ වූයේ ය. ඔහු ගේ තියුණු දෑස් ඈත දියඹ වෙත යොමුව පැවතිණ.

"මදර්ස් ඩේ එකක් අපට ඕන් නැහැයි කියල තාත්ති කිවුවෙ ඒකද?"
"ඔව් පුතා. අම්ම තාත්ත වයස්ගත වුණාට පස්සෙ මහලූ නිවාසෙකට ගාල් කරලා අවුරුද්දකට සැරයක් විතරක් තෑගි බෝග අරගෙන මල් පොකුරු අරගෙන බලන්න යන එකේ තේරුමක් තියනවැයි?"

හිමාන්සු ගේ ප්‍රශ්නවලට උත්තර බැඳීම රූපවාහිනී නිවේදකයකු ගේ පැනයකට පිළිතුරු සැපයීම තරම් පහසු නැති බව ඔහු අත්දැකීමෙන් ම දනී. තමා ගේ පිළිතුරුවල නැවුම් බවක් අරුතක් ගැබ් ව තිබිය යුතු වන්නේ හිමාන්සු සූක්ෂමාත්මතාවෙන් යුතු දරුවකු නිසා ය.

"අත්තම්මා බලන්න අපි මල් අරගෙන යන්නෙ නැත්තෙ ඇයි තාත්ති?"
"මොකටද? අපි අත්තම්මාට ගොඩක් දේවල් ගෙනියනවා නෙ පුතා. චීත්ත, හැට්ට රෙදි, සාරි, කනබොන දේවල්, බේත්හේත් ඒ ඔක්කොම අපි අරගෙන යනවා. ඉතිං මල් මොකටද?"

හිමාන්සු යළිත් වරක් කල්පනාවට වැටුණේ ය. ඔහු ගේ සිත තුළ දැවෙන ප්‍රශ්නයක් වන බවත් ඇහේ රොඩ්ඩක් මෙන් එය කැවෙමින් ඇති බවත් ඒ කුඩා නිල්දෑස තුළින් පැහැදිලි ව ම පෙනිණ.

"අවුරුද්දකට එක සැරයක් විතරක් අම්මලා බලන්න යන එකටද තාත්ති මදර්ස් ඩේ කියන්නෙ?"

"ඔව් පුතා. හුඟාක් දුරට ඒකෙන් අදහස් වෙන්නෙ එහෙම දෙයක් තමයි."
"ඉතිං ඒක නරකද?"

"රකයි නේන්නං"
"ඇයි?"
"ඇයි අහන්නෙ? අපි අම්මට තාත්තට එක දවසක් විතරද වෙන්කරන්න ඕන?"

හිමාන්සු යළි නිහඬ වූයේ ය. එවර ඔහු ගේ දෑස් යොමු ව පැවතුණේ මුහුදේ ඈතින් නැංගුරම් ලා ඇති කුඩාවට දිස්වන නැවක් දෙස ය.

"එතකොට අවුරුද්ද කියන්නෙ අපේ මදර්ස් ඩේ එකටද තාත්ති?"

තාරපාරට සමාන්තර ව පිහිටි රේල්පාරේ බර හඩක් නංවමින් බඩු කෝච්චියක් ඇදී යමින් තිබිණ. හැකරැල්ලකු මෙන් වංගුව ගන්නා දුම්රිය දෙස ඔහු පාෂාණිභූත ව බලා සිටියේ ය. මහත් වූ විපිළිසරයක් විළියක් ඔහු ගේ සිතට නැගිණ. රිය කණ්ණාඩිය තුළින් ඔහු පුතු දෙස බැලූවේ ඒ මුහුණේ සරදම් සිනාවක් මතු ව ඇද්දැ යි දැන ගැනීමට යි. එහෙත්, දැඩි කල්පනාකාරී බවක් හා අනියත වූ ශෝකී ස්වභාවයක් මිස අන්කිසිදු හැඟීමක් එහි සටහන් ව තිබුණේ නැත.

තමා කෙතරම් මුළාවකට නතු වී සිටියේ දැයි ඔහුට සිතිණ. මවුවරුන් ගේ දිනය අවඥාසහගත ලෙස හුවා දක්වමින්, සූර්ය මංගල්‍යය හා බැඳුණු සාරදහම් උත්කර්ෂයට නගමින් කටමැත දොඩවද්දී, නිකමට හෝ තමාට තමා ගේ මව සිහිවූයේ ද? පරසිරිත හෙළා දකිමින් මේ කොදෙව්ව තුළ ජීවත් වන්නන් ගේ මාපිය දූදරු සබඳතා පිළිබඳ සිංහනාද නංවද්දී, තමා අවසන් වරට මව බැහැදුටුවේ තුන්සිය හැටපස් දිනකට පෙර දී බව හාංකවිසියක් හෝ තමාට මතක් වූයේ ද?

ඔහු පුරෝගාමිත්වයේ නගරයට පිවිස සිටියේ ය. සුප්‍රකට ඩපානදුරා වාදයඞ අහඹු ලෙස ඔහු ගේ මතකයට නැගිණ. පාළුවට ගිය නගරය පසුකර යමින් ඔහු සිතුවේ මේ වන විට මේ රටේ මිනිසුන් බහුතරයක ගේ සිත් තුළ අවිඥානක ලෙස ඩමවුවරුන් ගේ දිනයඞ බවට පත් වී ඇත්තේ අද දවස දැයි කියා ය.